# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,533 - 2008 ජනවාරි මස 18 වැනි සිකුරාදා - 2008.01.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 50 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 59 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම් දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ජනවාරි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ජනවාරි මස 11 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## ඉල්ලුම්පත් කැඳවීම අවලංගු කිරීම

අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 108 වැනි වගන්තිය යටතේ (හදිසි) මරණ පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1525 දරන 2007 නොවැම්බර් මස 23 වැනි සිකුරාදා දිනැති *ගැසට් පත්‍රයේ* තනතුරු/ඇබෑර්තු යටතේ පළ වූ ඉහත සඳහන් දැන්වීමේ පහත සඳහන් ඡේදවල දක්වා ඇති හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසවලට අදාළව අයදුම්පත් කැඳවීම මෙයින් අවලංගු කරමි.

***මාතලේ දිස්ත්‍රික්කය***

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *හදිසි මරණ පරීක්ෂක කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය* |
|---|---|---|
| 3. මාතලේ | මාතලේ මහ නගර සභාව | ඊ350 සී |
| 4. ගලේවෙල | ගලේවෙල | බෙලිගමුව, ගලේවෙල, දමුණුමුල්ල, වලස්වැව නබඩගහවත්ත, නලකිරිගම ග්‍රාම සේවා වසම් ඇතුළත් |

***ගාල්ල දිස්ත්‍රික්කය***

| | | |
|---|---|---|
| 4. යක්කලමුල්ල | තෙල්ලඹුර | 176ඒ, 176ඩී, 177, 177ඒ, 177 බී, 177සී, 177ඩී, 177ඊ, 177එෆ්, 178ඒ, 179, 179 ඒ, 179 බී, 179සී, 179 ඊ |

***පුත්තලම දිස්ත්‍රික්කය***

| | | |
|---|---|---|
| 2. ආනමඩුව | කරඹෑපත්තුව | 651, 651ඒ, 652, 652ඒ, 652බී, 653, 653ඒ, 653බී, 653සී, 653ඩී, 655, 655ඒ |

සුහද කේ. ගම්ලත්,
ලේකම්,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

2007 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ දී ය.

01-509

---

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### ආධුනික නිළධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවල ආධුනික නිළධාරීන් සඳහා පුරප්පාඩු පවතී.

(අ) නියමු පොදු රාජකාරි ශාඛාව
(ආ) උපකරණ ශාඛාව
(ඇ) පරිපාලන ශාඛාව
(ඈ) පරිපාලන රෙජිමේන්තු ශාඛාව
(ඉ) මෙහෙයුම් ගුවන් ශාඛාව
(ඊ) ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව

2. පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

(අ) BSc (Aviataion Studies) උපාධිය සඳහා ඇතුල්වීමේ සුදුසුකම් (කැළණිය විශ්ව විද්‍යාලය මගින් පිළිගත් )

නියමු පොදු රාජකාරි/උපකරණ/පරිපාලන/පරිපාලන රෙජිමේන්තු සහ මෙහෙයුම් ගුවන් ශාඛාවන්

එක් වතාවකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් (අතිරේක හා වෛකල්පික විෂයයන් හැර) අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 6කින් සමත්ව තිබිය යුතු අතර ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් සහ සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුයි. තව ද එක් වතාවක දී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය යන විෂය ධාරාවන්ගෙන් (අදාළ ලෙස) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ආ) ජාතික ඩිප්ලෝමාව (තාක්ෂණ/ඉංජිනේරු/ඉංජිනේරු විද්‍යා) සඳහා ඇතුළ්වීමේ සුදුසුකම් : -

ගුවන් තොටුපල නිර්මාණ ශාඛාව :

එක් වතාවක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් (අතිරේක හා වෛයිකල්පික විෂයයන් හැර) අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් සහ සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුයි. තවද එක් වතාවක දී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඇ) වෙනත් ඇතුළ්වීමේ සුදුසුකම් :

නියමු පොදු රාජකාරි/ උපකරණ/ පරිපාලන / පරිපාලන රෙජිමේන්තු හා මෙහෙයුම් ගුවන් ශාඛාවන්.

එක් වතාවක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් (අතිරේක හා වෛයිකල්පික විෂයයන් හැර) අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් සහ සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුය. තව ද එක් වතාවක දී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය යන විෂය ධාරාවන්ගෙන් (අදාළ ලෙස) විෂයයන් දෙකකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි. තවද එක් වතාවක දී අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් කලා විෂය ධාරාව සඳහා පෙනී සිට අවම වශයෙන් විෂයයන් දෙකකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටින ශිෂ්‍යයින්ට ද පරිපාලන රෙජිමේන්තු ශාඛාව සඳහා අයදුම්කළ හැක.

3. *අනෙකුත් සුදුසුකම්.*—අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුයි.

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | :- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (ආ) | වයස | :- 2008 අප්‍රේල් මස 15 දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුයි. |
| (ඇ) | උස | :- අඩි 05 යි අඟල් 06කට නොඅඩු විය යුතුයි. |
| (ඈ) | බර | :- ශරීර ස්කන්ධ දර්ශකය බර (කි. ග්‍රෑ.) / උස (මී) 2 < 5 |
| (ඉ) | පපුව | :- අඟල් 32 ට නොඅඩු විය යුතුයි. |
| (ඊ) | වර්ණ දෘෂ්ටිය | :- සීපී2 |
| (උ) | දෘෂ්ටි තීක්ෂණත්වය | :- වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත) |
| (ඌ) | සිවිල් තත්ත්වය | :- අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයකුට පුහුණුව ලබන කාලයේ දී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. |

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිමි වලට අනුව උස හා ඇස් පෙනීම නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුනතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

6. *සේවා කොන්දේසි* : -

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව,මූලික නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති ශාඛාව අනුව මූලික ගොඩ බිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු, ඔහු ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිළයෙන් වෙනස්ව නියමු නිළධාරි නිළයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුයි.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකයකුටම සියලුම ආයිත්තම් සහිත, නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයන් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුලින් ආහාර සපයනු ලැබේ.

(ඊ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුල දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිවයුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ඌ) මව පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 20 වන කොටුවේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමඟ මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුය.

(එ) දෙවන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් නිළධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා කැඳවනු ලැබේ. නිළධාරි තත්ත්ව පරීක්ෂාවෙන් සමත්වන්නෝ වෛද්‍ය පරීක්ෂණයට (ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරාගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ) සුදුසුකම් ලබයි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වන නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් පියසර යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණයන්ගෙන් සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ

පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම ශාඛාවන්ට අවශ්‍ය වන්නාවූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දැක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිලධාරි නිවස්නයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක නිලධාරීන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අයකරනු ලැබේ.

(ඕ) සියලුම නිලධාරීන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත්වේ.

(ක) සියලුම නිලධාරීන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

7. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා : තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

8. *වැටුප් හා දීමනා* :

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනික නිලධාරීන්ගේ සහ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

කැඩේට් ඔෆිසර් - රු. 180,240 වසරකට
පයිලට් ඔෆිසර් - රු. 211,800 වසරකට
ෆ්ලයින් ඔෆිසර් - රු. 275,220 - 34 x 7,740 - රු. 538,380 වසරකට
ෆ්ලයිට් ලෙප්ටිනන් - රු. 321,660 - 28 x 7,740 - රු. 538,380 වසරකට
ස්කෝඩ්‍රන් ලීඩර් - රු. 352,620 - 24 x 7,740 - රු. 538,380 වසරකට
විංග් කොමාන්ඩර් - රු. 362,100 - 20 x 9,480 - රු. 551,700 වසරකට
ග්‍රෲප් කැප්ටන් - රු. 441,060 - 18 x 12,600 - රු. 667,860 වසරකට

ආ. *අනෙකුත් දීමනා* :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 2,125 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250 0 ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600 0ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාත්විත සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 2,400 ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000 ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරි දිනට රු. 100 බැගින් ගෙවනු ලැබේ.)
(6) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255 ක් ගෙවනු ලැබේ.
(7) බැට්මන් දීමනාව මසකට රු. 637.50ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(8) ආහාර දීමනාව මසකට රු. 7,233.23 (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(9) සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිම රු. 637.50ක් ගෙවනු ලැබේ.
(10) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට කලත්‍රයාට සහ ළමයින්ට) දෙනු ලැබේ.
(11) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(12) නිල ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(13) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට) සපයනු ලැබේ.
(14) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන් හට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට ගමන් කිරීම සඳහා නොමිලේ ගමන් කිරීමට බලපත්‍රයක් දෙනු ලැබේ.
(15) පියාසර දීමනාව නියමු පොදු රාජකාරි සඳහා ගෙවනු ලැබේ.
(16) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට පහත සඳහන් පරිදි ගෙවල් කුලී දීමනාවන් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ග්‍රෲප් කැප්ටන් සහ ඉන් ඉහල නිලයන්ට මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා වේ.

09. *විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා.*—වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප්/ පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. සියලුම නිලධාරීන් වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට දායකයින් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව වේ.

10. *අයදුම්කරුවන්ට උපදෙස්.*—

අ. පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියළුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2008 ජනවාරි මස 29 වැනි දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ "ප්‍රධාන ආධුනිකයන් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයන් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත බහාලන කවරයේ "ආධුනික නිලධාරි සඳහා ඉල්ලුම්පත් ශාඛාව" යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

ආ. රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරාගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය)
(2) අයදුම්කර ඇති ශාඛාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික
(3) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.
(4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගේ හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.
(5) ක්‍රීඩා හා ශිෂ්‍ය හට යනාදිය පිළිබඳ සහතිකය.

ඈ. නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

ඊ. අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

12. *තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය* :

අ. ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අපේක්ෂකයන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේය. ඉන් තෝරාගනු ලබන අපේක්ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයනට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

ආ. සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් හට පරීක්ෂණ පවත්වන දිනය වේලාව හා ස්ථානය ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් ගෙවනු නොලැබේ.

ඇ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය.

ඈ. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

ඉ. අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතුවන්නේය.

ඊ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැපැල් පෙට්ටිය 594.
කොළඹ .

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික නිලධාරීන් සඳහා ඉල්ලුම්පත**
**ගුවන් හමුදාවේ ………… ශාඛාව**

1. පුරවැසිභාවය :— — — — —.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :— — — — —.

3. ජාතික හැඳුනුම්පත් අංකය :— — — — —.

4. ස්ථිර ලිපිනය :— — — — —.

5. තැපැල් ලිපිනය :— — — — —.

6. උපන් දිනය :— — — — —.

වයස (2008 අප්‍රේල් මස 15 දිනට)

අවුරුදු : — — —. මාස : — — —. දින : — — —.

7. උස අඩි :— — — — —. අඟල් :— — — — —.

8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :— — — — —.

9. දිස්ත්‍රික්කය :— — — — —.

10. ඡන්ද කොට්ඨාශය :— — — — —.

11. ග්‍රාම නිලධාරි කොට්ඨාශය :— — — — —.

12. දුරකථන අංකය :— — — — —.

13. විවාහක හෝ අවිවාහක බව :— — — — —.

14. පාසැල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :— — — — —.

| *පාසැලේ/විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයන් (ශ්‍රේණි ඇතුලුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ)<br>අ.පො.ස. (උ.පෙළ)<br>වෙනත් | | |

15. පාසැලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :

| *සේවායෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

16. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැන් ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

17. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :— — — — —.

18. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග' සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.) :— — — — —.

19. පාසැලේදී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමඟ විස්තර දක්වන්න) :— — — — —.

20. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :— — — — —.

21. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීන් පෙර ඉල්ලුම් කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :—————.

22. සිවිල් හෝ යුධ අධිකරණයකදී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :—————.

23. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :—————.

24. චරිත සහතික පිළිබඳ විස්තර:—————.

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

25. *අයදුම්කරු විසින් අත්සන් කළයුතු ප්‍රකාශය :*

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

—————.
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :—————.

26. *ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :*

(අ) ඉහත අයදුම්පතේ 19 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ............... නැමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළදී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා *නැතහොත්* ඔහුටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අධිකාරියක් ලැබීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

—————.
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :—————.
නම :—————.
(පැහැදිලි අකුරෙන්)
ලිපිනය :—————.

—————.
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :—————.
(පැහැදිලි අකුරෙන්)
ලිපිනය :—————.

—————.
දෙවන සාක්ෂිකරුගේ අත්සන

නම :—————.
(පැහැදිලි අකුරෙන්)
ලිපිනය :—————.

අදාල නොවන වචන කපා හරින්න.

01-527

---

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### කාන්තා ආධුනික නිළධාරී පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පරිපාලන රෙජිමේන්තු ශාඛාවේ කාන්තා ආධුනික නිළධාරීන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් සුදුසුකම් ඇති කාන්තා අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

(අ) BSc (Aviation Studies) උපාධිය සඳහා ඇතුල්වීමේ සුදුසුකම් (කැළණිය විශ්ව විද්‍යාලය මගින් පිළිගත්)

එක් වතාවකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 6කින් සමත්ව තිබිය යුතු අතර ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් සහ සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුයි. තවද එක් වතාවකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය යන විෂය ධාරාවන්ගෙන් (අදාල ලෙස) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ආ) ඇතුල්වීමේ වෙනත් සුදුසුකම් :

එක් වතාවකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් (අතිරේක හා වෛයිකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් සම්මාන 04ක් සහිතව විෂයයන් 06කින් සමත්ව තිබිය යුතු අතර ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයන් සහ සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුය. තවද එක් වතාවකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය/කලා යන විෂය ධාරාවන්ගෙන් (අදාල ලෙස) විෂයයන් දෙකකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

3. *අනෙකුත් සුදුසුකම්.*—අයදුම්කාරිය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යෙන්ම සපුරාලිය යුතුයි.

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | :- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (ආ) | වයස | :- 2008 අප්‍රේල් මස 15 දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුයි. |
| (ඇ) | උස | :- අඩි 05 යි අඟල් 04කට නොඅඩු විය යුතුයි. |
| (ඈ) | බර | :- ශරීර ස්කන්ධ දර්ශකය බර (කි. ග්‍රෑ.) / උස (මී) 2 <25 |
| (ඉ) | වර්ණ දෘෂ්ටිය | :- සීපී2 |
| (ඊ) | දෘෂ්ටි තීක්ෂණත්වය | :- වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් රහිත) |
| (උ) | සිවිල් තත්ත්වය | :- අපේක්ෂිකාවන් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනියෙකුට පුහුණුව ලබන කාලයේදී සහ |

අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂිකාවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම් වලට අනුව උස හා ඇස් පෙනීම නොමැති අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කාරියකගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුනතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඇය ගැන සලකා බලනු ලැබේ.

6. *සේවා කොන්දේසි* : -

(අ) අපේක්ෂිකාවන් අනෙකුත් නිළයන් හා සමානව,මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකාවන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. තෝරාගත් අපේක්ෂිකාවන් මූලික ගොඩ බිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු, ඇය ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිළයෙන් වෙනස්ව නියමු නිළධාරි නිළයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකාවන් සූදානමින් සිටිය යුතුයි.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකාවකටම සියලුම ආයිත්තම් සහිත, නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකාවන් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුලින් ආහාර සපයනු ලැබේ.

(ඊ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුලදී යම් නිලධාරිනියෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනික නිලධාරිනිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනික නිලධාරිනියගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුල ඕනෑම අවස්ථාවකදී යම්කිසි ආධුනික නිලධාරිනියකගේ නොමනා හැසිරීම මත හෝ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිවයුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ ආධුනික නිලධාරිනියගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ඌ) මව පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 26 වන කොටුවේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂිකාවන් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමඟ මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුය.

(එ) දෙවන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂිකාවන් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් නිළධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා කැඳවනු ලැබේ. නිළධාරි තත්ත්ව පරීක්ෂාවෙන් සමත්වන්නේ වෛද්‍ය පරීක්ෂණයට (ආධුනික නිළධාරිනියන් වශයෙන් බැඳීමට ප්‍රථම තෝරාගනු ලබන සියළුම අපේක්ෂිකාවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ) සුදුසුකම් ලබයි. පරීක්ෂණයන්ගෙන් සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂිකාවන්ගෙන් එම ශාඛාවන්ට අවශ්‍ය වන්නාවූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හිදී සහ සම්මුඛ පරීක්ෂණයන්හිදී දැක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක නිළධාරිනියන්, නිළධාරි නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිළධාරිනියන්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිලධාරි නිවස්නයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක නිළධාරිනියන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාල පරිදි අය කරනු ලැබේ.

(ඕ) සියලුම නිළධාරිනියන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියලුම නිළධාරිනියන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා* : තෝරාගනු ලබන අපේක්ෂිකාවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

8. *වැටුප් හා දීමනා* :

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනික නිළධාරිනියන්ගේ සහ අධිකාරිලත් නිළධාරිනියන්ගේ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

කැඩෙට් ඔෆිසර් - රු. 180,240 වසරකට
පයිලට් ඔෆිසර් - රු. 211,800 වසරකට
ෆ්ලයිට් ඔෆිසර් - රු. 275,220 - 34 x 7,740 = රු. 538,380 වසරකට
ප්ලයිට් ලෙප්ටිනන් - රු. 321,660 - 34 x 7,740 = රු. 538,380 වසරකට
ස්කෝඩ්‍රන් ලීඩර් - රු. 352,620 - 24 x 7,740 = රු. 538,380 වසරකට
විංග් කොමාන්ඩර් - රු. 362,100 - 20 x 9,480 = රු. 551,700 වසරකට
ගෲප් කැප්ටන් - රු. 441,060 - 18 x 12,600 = රු. 667,860 වසරකට

(ආ) *අනෙකුත් දීමනා* -

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 2,125.00 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කල පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600 0ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 2,400 ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,000 0ක් යාපන අර්ධද්වීපයේ සේවය කරන්නන් සඳහා ගෙවනු ලැබේ. (රාජකාරි දිනට රු. 100 0 බැගින් ගෙවනු ලැබේ.)

(6) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255 0 ක් ගෙවනු ලැබේ.

(7) බැට්මන් දීමනාව මසකට රු. 637 50ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(8) ආහාර දීමනාව මසකට රු. 7,233 23 (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(9) සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිම රු. 637 50ක් ගෙවනු ලැබේ.

(10) නොමිලේ ගමන් කල හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරිනියට කලත්‍රයාට සහ ළමයින්ට) දෙනු ලැබේ.

(11) කඳවුර තුළ වාසය කරන නිලධාරිනියන්ට මසකට වරක් නිළධාරී නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(12) නිළ ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(13) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට) සපයනු ලැබේ.

(14) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිළධාරිනියන් හට සැතපුම් 30ක් තුල රාජකාරි ස්ථානයට ගමන් කිරීම සඳහා නොමිලේ ගමන් කිරීමට බලපත්‍රයක් දෙනු ලැබේ.

(15) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිළධාරිනියන්ට පහත සඳහන් පරිදි ගෙවල් කුලී දීමනාවන් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ගෲප් කැප්ටන් සහ ඉන් ඉහල නිළයන්ට මසකට රු. 1,600 0 සිට රු. 4,250 0 දක්වා වේ.

09. *විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා*

වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප්/ පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. සියලුම නිළධාරිනියන් වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව වේ.

10. *අයදුම්කාරියන්ට උපදෙස්* : -

අ. පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියළුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කල යුතුයි. ඉල්ලුම්පත් 2008 ජනවාරි මස 29 වැනි දින දහවල් 1200ට ප්‍රථම ලැබෙන සේ "ප්‍රධාන ආධුනිකයන් බඳවා ගැනීමේ නිළධාරි, ආධුනිකයන් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත බහාලන කවරයේ "කාන්තා ආධුනික නිළධාරිනියන්" සඳහා ඉල්ලුම්පත් පරිපාලන රෙජිමේන්තු ශාඛාව යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

ආ. රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කාරියන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂිකාව තෝරා ගතහොත් නිදහස් කල හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ /සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂිකාවන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කල සහතිකය)

(2) අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික

(3) පිලිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික

(4) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගේ හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(5) ක්‍රීඩා හා ශිෂ්‍ය භට යනාදිය පිළිබඳ සහතිකය

ඈ. නියම කරන ලද අවස්ථාවන්හිදී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂිකාවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

ඊ. අයදුම්පත සමග සහතික වල මුල් පිටපත් එවා ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂිකාව තෝරා ගැනීමට ප්‍රථම හෙලිදරව් වුවහොත් ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඇය සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

12. *තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය* : -

අ. ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂිකාවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අපේක්ෂිකාවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණ වලට පෙනී සිටීමට සිදුවන්නේය. ඉන් තෝරාගනු ලබන අපේක්ෂිකාවන් ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂනයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

ආ. සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු ලබන අපේක්ෂිකාවන් හට පරීක්ෂණ පවත්වන දිනය වේලාව හා ස්ථානය ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් ගෙවනු නොලැබේ.

ඇ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කාරියකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

ඈ. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

ඉ. අපේක්ෂිකාවකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කල යුත්තේ ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම, අපේක්ෂිකාව නුසුදුසු අයෙක් වීමට හේතුවන්නේය.

ඊ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂිකාවන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ඩී. ආර්. එම්. ජේ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැපැල් පෙට්ටිය 594.
කොළඹ .

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික කාන්තා නිළධාරිනියන් සඳහා ඉල්ලුම්පත පරිපාලන රෙජිමේන්තු ශාඛාව**

1. පුරවැසිභාවය :—————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :—————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
4. ස්ථිර ලිපිනය :—————.
5. තැපැල් ලිපිනය :—————.
6. උපන් දිනය :—————.

වයස (2008 අප්‍රේල් මස 15 දිනට)

අවුරුදු :—————. මාස :—————. දින :—————.

7. උස අඩි :—————. අඟල් :—————.
8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.
9. දිස්ත්‍රික්කය :—————.
10. ඡන්ද කොට්ඨාශය :—————.
11. ග්‍රාම නිලධාරි කොට්ඨාශය :—————.
12. දුරකථන අංකය :—————.
13. විවාහක හෝ අවිවාහක බව :—————.
14. පාසැල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :—————.

| *පාසැලේ/විශ්ව විද්‍යාලයේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයන් (ශ්‍රේණි ඇතුලුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ)<br>අ.පො.ස. (උ.පෙළ)<br>වෙනත් | | |

15. පාසැලෙන්/විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කල රක්ෂා පිළිබඳ විස්තර :

| *සේවායෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

16. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැන් ලිපිනය |
|---|---|---|---|
| පියා<br>මව | | | |

17. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :—————.
18. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග' සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.) :—————.
19. පාසැලේදී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමඟ විස්තර දක්වන්න) :—————.
20. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හේ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :——————.
21. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීත් පෙර ඉල්ලුම් කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :—————.
22. සිවිල් හෝ යුධ අධිකරණයකදී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :—————.
23. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්ව විද්‍යාල, රජය විසින් පාලන කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :—————.
24. චරිත සහතික පිළිබඳ විස්තර :—————.

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

25. අයදුම්කාරිය විසින් අත්සන් කළයුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්න වලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

—————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

26. ඉල්ලුම්කාරියගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(අ) ඉහත අයදුම්පතේ 19 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ………… නැමැති අපේක්ෂිකාවගේ මව/පියා/බාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කාරිය පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළදී පහත නම් සඳහන් අයදුම්කාරිය ආධුනිකත්වයන් සඳහා ඇයගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කාරිය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කාරිය අධිකාරියක් ලැබීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින්

වාර්තා කරනු ලැබුවහොත් ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

________,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :________.

නම :________.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :________.

________,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :________.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :________.

________,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :________.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :________.

01-528

---

## පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

### විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සේවය ස්වේච්ඡා පදනමින් ලබා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

පරිසර සංරක්ෂණය සහ ස්වභාවික සම්පත් කළමනාකරණය සීමිත සේවක සංඛ්‍යා සහ සම්පත් හිඟ රාජ්‍ය ආයතන වලට බලවත් අභියෝගයක් වී ඇත. ස්වභාවික සම්පත් රැක ගැනීම හා පරිසර දූෂණය වැළැක්වීමේ අසීරු කාරණයට තමන් සතු දැනුම සහ පුහුණුව කැපකිරීමට කැමති රාජ්‍ය අංශයේ සේවය කොට විශ්‍රාම ගිය ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සේවය ස්වේච්ඡා පදනමක් මත ලබාගැනීම පිණිස නව සංකල්පයකින් යුතු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත. මෙහිදී ප්‍රාදේශීය/දිස්ත්‍රික්/ජාතික මට්ටමින් ස්ව කැමැත්තෙන් සේවය ලබා දීමට මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන හා වෙනත් බැඳීම් වලින් තොර ජ්‍යෙෂ්ඨ පුරවැසියන් නිර්වේතනික පදනමක් මත ලබා ගැනීමට අපේක්ෂිතයි. ඒ අනුව පරිසර සංරක්ෂණය සහ ස්වභාවික සම්පත් කළමණාකරණය සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය, ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්තව විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගෙන් ස්වේච්ඡා සේවය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

*සුදුසුකම්.-* 1. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්තව සිට විශ්‍රාම ගිය පුරවැසියන් වීම. සහ

2. පරිසර සංරක්ෂණයට හා ස්වභාවික සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් සංවේදීතාවයක් හා ඇල්මක් ඇති අය වීම.

*සේවය ලබාගන්නා පදනම*.-

1. මෙම සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් කිසිදු වැටුපක් හෝ දීමනාවක් ගෙවනු නොලබන අතර ගරු සේවයක් ලෙස පමණක් සලකනු ලැබේ.

2. තෝරාගන්නා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.

*සේවය අවශ්‍ය ක්ෂේත්‍රයන් .-*

*වන සංරක්ෂණය සහ දැව සැපයීම.-*වනාන්තර සංරක්ෂණය හා පුද්ගලික ඉඩම්වල වන වගා ස්ථාපනය කිරීම සඳහා ජනතා දායකත්වය ලබා ගැනීමේ ප්‍රවර්ධකයන් වශයෙන් ක්‍රියා කිරීම, වනාන්තර ආශ්‍රිතව විවිධ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඒවායින් පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා පනවනු ලැබ ඇති කොන්දේසි නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි සොයා බැලීම.

දැව ක්ෂේත්‍රයේ අලෙවි හා පර්යේෂණ අංශ ප්‍රවර්ධනයට උපදේශාත්මක සේවය ලබා ගැනීම.

වනජීවී සංරක්ෂණය.-වනෝද්‍යාන ඇතුළත හා වනෝද්‍යානවලට පිවිසීමේ මාර්ග සකස් කිරීම, ඒවා ක්‍රමවත්ව නඩත්තු කිරීම සහ නියං කාලයේ දී වනසතුන්ට ජලය සැපයීමට හැකිවන සේ වනෝද්‍යාන තුළ පිහිටි වැව් හා ජලාශ සංරක්ෂණයට, අලි මිනිස් ගැටුම අවම කිරීමට මහජන සහාය ලබා ගැනීම සම්බන්ධීකරණය.

*පරිසර ආරක්ෂණය.-*නාගරික හා ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි පාරිසරික ගැටළු ලිහිල් කිරීම සඳහා වූ යාන්ත්‍රණයකට සහභාගි කරවා ගැනීම සහ පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා ප්‍රාදේශීය මට්ටමින් යොදවා ගැනීම.

සමුද්‍ර දූෂණය වැළැක්වීම.-නාවික යාත්‍රා වලින් දැවි තෙල් සාගරයට මුදා හැරීම අවම කිරීමට දායකත්වය ලබා ගැනීම, සාගරය තුළ තෙල් ගවේෂණය හා කැනීම් හා සම්බන්ධ සමුද්‍ර පරිසර සංරක්ෂණයට සහාය ලබා ගැනීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ඉංග්‍රීසි, දෙමළ හා වෙනත් භාෂා ප්‍රවීනතාවය අවශ්‍යතාවයට දායකත්වය ලබා දීම.

*භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම්.-*භූ විද්‍යා සමීක්ෂණ, ගවේෂණ සහ භූ භෞතික විද්‍යා සමීක්ෂණ පැවැත්වීම, මිහිපිට හා මිහිමත කැණීම් සහ කැණීම් අංශයේ පුනරුත්ථාපනය, ඛණිජ කළමනාකරණය, නීති පනත් සංශෝධනය, ව්‍යාපෘති සැලසුම් හා සංයුක්ත සැලසුම් සම්පාදනය, දුරස්ථ නිරීක්ෂණය හා භූගෝලීය තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම සඳහා විවිධ සහාය ලබා ගැනීම.

*අයදුම් කිරීමේ ක්‍රමය.-*සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර, ලේකම්, පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය, අංක 82, සම්පත්පාය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට 2008.02.08 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම්පස කෙළවර "ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සේවය" යනුවෙන් ලියා දැක්විය යුතුය.

**පරිසර සංරක්ෂණය සහ ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුක්තව සිට විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සේවය ස්වේච්ඡා පදනම මත ලබා ගැනීමේ අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

02. ලිපිනය :————.

03. (i) පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————.

(ii) ග්‍රාම සේවා කොට්ඨාශය :————.

(iii) සේවය සැලසීමට කැමති ප්‍රදේශය/දිස්ත්‍රික්කය :————.

04. උපන් දිනය:————. 2008.01.25 දිනට වයස :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. විශ්‍රාම ගිය දිනය :————.

08. විශ්‍රාම යන විට දැරූ තනතුර :————.

09. විශේෂ කුසලතාවයන් :————.

10. දැනට යම් සේවයක නියුක්තව සිටිනම් ඒ පිළිබඳ විස්තර :————.

11. දුරකථන අංකය :————.

12. කුමන දෙපාර්තමේන්තු, සංස්ථාපිත ආයතන සඳහා ඔබගේ ගරු සේවය ලබා දීමට අදහස් කරන්නේ ද යන වග :————.

ඉහත දක්වා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

— — — — —,
අයදුම්කරුගේ අත්සන.

දිනය:— — — — —.

එම්. ඒ. ආර්. ඩී. ජයතිලක,
ලේකම්,
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය.

01-576

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2006**

අංක 1499 දරන 2007 මැයි මස 25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද උක්ත විභාග නිවේදනය හා බැඳේ.

02. එම විභාග නිවේදනයේ "8.0 - යෝග්‍යතාවය" ඡේදයෙහි අංක (iii) ඡේදයට පසුව අංක (iv) ලෙස පහත දැක්වෙන ඡේදය ඇතුළත් කරනු ලැබේ.

"ඉහත (iii) ඡේදය යටතේ දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් 2001.11.26 දිනට සේවයේ ස්ථිර කර ඇති කණිෂ්ඨ සේවකයන් සඳහා අදාළ නොවේ."

03. තවද එම විභාග නිවේදනයේ "9.0 - (iii)" ඡේදය යටතේ දක්වා ඇති අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2008.02.08 දක්වා දීර්ඝ කරනු ලබන අතර මේ වන විට අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත වරක් අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බවද වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

ඒ. නෝබට්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2007 දෙසැම්බර් මස 27 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

01-575

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.